දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - 03 කොටස - 2019
-----------------------------------------------------------------

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - 03 කොටසේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය
--------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - 03 කොටසේ, මුළු දිග වැටිය සිට අන්දරවැව දක්වා කි.මී 15 ක් පමණ වේ. හම්බන්තොට ජාත්‍යන්තර අගනගර සංවර්ධන කටයුතු සඳහා ආධාර කිරීම හා පහසුකම් සැලසීම වෙනුවෙන් මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ එක් ප්‍රධාන අරමුණක් ලෙස හඳුනා ගැනුණි. යෝජිත දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව මාතර සිට බෙලිඅත්ත (01 කොටස), බෙලිඅත්ත සිට වැටිය (02 කොටස), වැටිය සිට අන්දරවැව (03 කොටස) සහ මත්තල සිට අන්දරවැව හරහා හම්බන්තොට දක්වා (04 කොටස) ලෙස කොටස් හතරකට බෙදා තිබුණි. ණය ගිවිසුම් වලට අනුව, 03 කොටසේ ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලියන 36,174 ක් වූ අතර සිවිල් වැඩ සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 252 කට සමාන රු. මිලියන 31,574 ක් චීනයේ අපනයන ආනයන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2016 ජනවාරි 25 දින ආරම්භ කර තිබුණු අතර 2018 ජනවාරි 25 දින වන විට අවසන් කිරීමට නියමිතය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය 2019 ජුනි 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3** මතය
------

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4** මතය සඳහා පදනම
-------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
--------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 8 ට පටහැනිව, ඉඩම් අත්පත් කර ගැනීම් මත පොළී ගෙවීම් සඳහා 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදන සලසා නොතිබුණි. | වත්කම් හා වගකීම් අවතක්සේරු වීම. | එකඟවෙමි. 2019 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේදී ගෙවිය යුතු ප්‍රමාද පොලිය ගෙවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 08 අනුව මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සැලසිය යුතුය. |

3. භෞතික කාර්යසාධනය

3.1 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- | --- |
| (අ) | කොන්ත්‍රාත්කරු විසින් එ.ජ. ඩොලර් 5,060,994 ක් වටිනා ඇතැම් යන්ත්‍ර සූත්‍ර රඳවා ගැනීමට ඉල්ලා තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු විසින් කරන ලද බදු ගෙවීම් සම්බන්ධයෙන් කිසිදු ලේඛනමය සාක්ෂියක් නොතිබුණි. | කොන්ත්‍රාත්කරුට අනිසි ප්‍රතිලාභ අත්වීම. | ගිවිසුමට අනුකූල වීම සඳහා පිරියත /උපකරණ 2021 පෙබරවාරි 22 දිනට පෙර බැහැර කරන බව කොන්ත්‍රාත්කරු තහවුරු කර ඇත. දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව 2 හි අවසාන තහවුරුව තවමත් සහතික කර නොමැති බැවින්, පිරියත/උපකරණ බැහැර කිරීම වෙනුවෙන් කිසියම් මගහැරුණු රේගු ගාස්තුවක් හෝ බද්දක් දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව 2 ව්‍යාපෘතියෙන් අඩු කළ හැක. | ශ්‍රී ලංකා රජයට බදු ගෙවීමට හෝ යන්ත්‍රෝපකරණ ප්‍රතිඅපනයනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - 02 අදියර 2020 පෙබරවාරි 25 දින සැලකිය යුතු ලෙස නිම කර තිබුණු අතර එසේම දෝෂ දැනුම්දීමේ කාලය 2021 පෙබරවාරි 24 දිනෙන් අවසන් වේ. එම තත්ත්වය තුළ ව්‍යාපෘතිය විසින් 2019 සැප්තැම්බර් 25 දින එම ව්‍යාපෘතියට එ.ජ. ඩොලර් 10,363,385 ක් වටිනා උපකරණ මාරු කර තිබුණි. | අපනයනය කළ හැකි භාණ්ඩ බදු නොගෙවා තබා ගැනීමෙන් කොන්ත්‍රාත්කරුට අනිසි ප්‍රතිලාභ අත්වීම. | එබැවින් කොන්ත්‍රාත්කරු උපකරණ යෙදවීමත් සමඟ දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - 02 අදියරයේ අභිමි වූ ප්‍රගතිය ලබා ගැනීමට පෙළඹී ඇති අතර දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - 03 අදියර සඳහා ආනයනය කරන ලද යන්ත්‍රෝපකරණ 2 අදියර අවසන් වන තුරු තබා ගැනීමෙන් 2 අදියර නියමිත අවසන් දිනයට පෙර නිම කරන ලදී. | ශ්‍රී ලංකා රජයට බදු ගෙවීමට හෝ යන්ත්‍රෝපකරණ ප්‍රතිඅපනයනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මධ්‍යම පරිසර අධිකාරියේ සහ භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ උපදෙස් කඩකරමින් කොන්ත්‍රාත්කරු විසින් කඳුකරයේ පස් ඉවත් කර තිබුණි. මෙමගින් පුද්ගලික ඉඩම් හිමියන් පස් දෙනෙකුට අනාරක්ෂිත තත්ත්වයක් නිර්මාණය වී තිබුණි. මෙම තත්ත්වය නිවැරදි කිරීමට බලධාරීන් කිසිදු පියවරක් ගෙන | පාරිසරික විනාශයන් සහ අපහසුතාවන් මෙන්ම අනාරක්ෂිත තත්ත්වයන් ඇති විය හැකිය. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ පාංශු කමිටුව කැණීම් බලපත්‍ර ලබා දීම සම්බන්ධ බලධාරීහු වනු ඇත. එබැවින් පස් ලබාගන්නා වලවල් නිරීක්ෂණය කිරීම සහ නිවැරදි කිරීම අපගේ විෂය පථයෙන් බැහැර වනු ඇත. | පරිසර විනාශයන් සහ අපහසුතා මෙන්ම අනාරක්ෂිත තත්ත්වයන් අවම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණි. ඉඩම් හිමියන් විසින් පස් ලබා දුන් සැපයුම්කරු ව්‍යාපෘතියේ පාංශු සැපයුම් ලැයිස්තුවේ ලියාපදිංචි වී නොතිබුණි. එමෙන්ම මහවැලි අධිකාරියේ ඉඩම්වල විශාල වළවල් ගොඩ නොකිරීම නිසා වැසි ජලයෙන් පිරී පැවතුණි. | | | |
| (ඇ) | අදාළ කොන්ත්‍රාත්කරුගේ පිරිවැයෙන් කාර්ය සාධන ඇපකරයක් ලබා ගතයුතු බවට වන කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි 4.2 උප වගන්තිය යටතේ ඇති විධිවිධානවලට පටහැනිව, කොන්ත්‍රාත්කරුවන්ට කාර්ය සාධන ඇපකර සැපයීමේ පිරිවැය සඳහන් කිරීමට ඉඩ දෙමින් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතම සකස් කර තිබුණි. ඒ අනුව කාර්ය සාධන ඇපකරවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා රු. මිලියන 99 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට අතිරේකව ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය වාසියක් අත්වීම. | කොන්ත්‍රාත් කොන්දේසිවල කාර්ය සාධන ඇපකර ඔහුගේම වියදමින් සැපයිය යුතු බව යන්නෙන් අදහස් කරන්නේ, කාර්ය සාධන ඇපකරය ඉදිරිපත් කිරීම පාර්ශව අතර ගිවිසුමකට එළැඹීමට පූර්ව අවශ්‍යතාවයක් වන අතර ඉන් පසුව කොන්ත්‍රාත්කරුට එකවර ගෙවීමක් ලෙස කොන්ත්‍රාත් පිරිවැය පත්‍ර අයිතම 1.2 (4) යටතේ කාර්ය සාධන ඇපකරයේ පිරිවැය ලැබීමට හිමිකම් ඇති බවයි. | ලංසු ලේඛන නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥයා සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය කිරීම සිදු කළ යුතුය. |
| (ඉ) | ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනයන්ට අනුව, අධිවේගී මාර්ගයේ වැටිය සිට අන්දරවැව දක්වා සේවා ස්ථාන ඉදිකිරීමට හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, අධිවේගී මාර්ගය භාවිත කරන්නන් හට පහසුකම් සැලසීම සඳහා සේවා ප්‍රදේශය සැලසුම් කිරීමට හෝ අධිවේගී මාර්ග ප්‍රමාණ පත්‍රවල ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කර නොතිබුණි. | වැලිපන්න සිට හම්බන්තොට දක්වා සේවා ප්‍රදේශයක් නොමැතිව දුර ගමන් කිරීමෙන් (කි.මී. 173) සාමාන්‍ය ජනතාව පීඩාවට පත් වීම. | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘති කොන්ත්‍රාත් ප්‍රමාණ පත්‍ර කිසිවක සංකල්පීය අවධියේදී සිවිල් වැඩ කොන්ත්‍රාත්තු හරහා සේවා ප්‍රදේශ ඉදිකිරීමට ප්‍රතිපාදන සපයා නැත. | හැකි ඉක්මනින් සේවා ප්‍රදේශයක් සඳහා පහසුකම් සැලසීමට කටයුතු කළ යුතුය. |